**ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය**

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

# තනතුරු පුරප්පාඩු

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ පවතින දිවයිනේ ප්‍රමුඛතම ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන ආයතනයක් වන අප ආයතනය ජාතික අවශ්‍යතා මත පදනම්ව ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති මෙන්ම කාර්මික තාක්ෂණික සේවා සැපයීමද සිදුකරනු ලැබේ.

අප මධ්‍යස්ථානයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් සහිත කාර්යශූර ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | | |
|---|---|---|
| **තනතුර** | : | **රියදුරු** |
| **මූලික අධ්‍යාපන සුදුසුකම්** | : | විෂයන් 02 කට සම්මාන සාමාර්ථ සමග විෂයන් 6 ක් සහිතව අ.පො.ස. (සා/පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම. |
| **වෘත්තීය සුදුසුකම්** | : | වලංගු බර වාහන රියදුරු බලපත්‍රයක් ලබාතිබීම<br>සහ<br>රියදුරු බලපත්‍රය ලබාගැනීමෙන් පසුව පිළිගත් ආයතනයක වසර 3 කට නොඅඩු රියදුරු පළපුරුද්ද. |
| **වයස** | : | අවුරුදු 18–45 අතර විය යුතුය<br>(රාජ්‍ය සංස්ථා, මණ්ඩල සහ රාජ්‍ය ආයතනවල අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.) |
| **වැටුප් පරිමාණය**<br>(2020 වසරේ සිට ක්‍රියාත්මක වන පරිදි) | : | PL 3 - 2016 : 26,290(10x270-10x300-10x330-12x350)39,490 |
| **වැටුප**<br>(2019 වසර සඳහා) | : | රු. 23,566 + 1,755/- (මූලික වැටුප + ගැළපුම් දීමනාව) |

**අනෙකුත් ප්‍රතිලාභ :**

- ජීවන වියදම් දීමනාව (වර්තමාන ජීවන වියදම් දීමනාව රු.7,800/-)
- සේවක අර්ථසාධක අරමුදල සඳහා ආයතනයේ දායකත්වය 15% ක් වන අතර සේවකයාගේ දායකත්වය 10% කි.
- සේවා නියුක්තියන්ගේ භාර අරමුදල සඳහා ආයතනයේ දායකත්වය 3% කි.

**අයදුම්පත් යොමු කිරීම :**

ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ සම්බන්ධකර ගත හැකි විස්තරද සමග (නම්, ලිපිනයන්, දුරකථන අංක ද ඇතුළුව) ඔබගේ විස්තරාත්මක ජීව දත්ත සටහනක් අදාළ සහතික පිටපත්ද සමග 2019.03.20 **දිනට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන්** අධ්‍යක්ෂ (මානව සම්පත්), නර්ඩ් මධ්‍යස්ථානය, කාර්මික ජනපදය, ඒකල, ජා ඇල වෙත යොමුකළ යුතුය. නැතහොත් ආයතනයට ගෙනැවිත් බාරදිය හැකිය. අයදුම් කරනු ලබන තනතුර ලියුම් කවරයේ ඉහළ කොටසේ වම් කෙළවරේ සඳහන් කළ යුතුය.

* රාජ්‍ය සංස්ථා, මණ්ඩල සහ රාජ්‍ය ආයතනවල අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානී මගින් යොමු කළ යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය
කාර්මික ජනපදය
ඒකල, ජා ඇල.

දුරකථන : 011-2236284, 2236384, 2236307

වෙබ් අඩවිය : www.nerdc.lk